## සාමාන්‍ය සමය තිස්තුන්වන සතිය

### සඳුදා

පළමුවන කියැවීම 1 මකබි 1: 10-15, 41-43, 54-57, 62-64

මකබ්වරුන්ගේ පළමුවන පොතෙන් ගත් පාඨයෙකි.

**"ඊශ්‍රායෙල්වරුන් හට උදා වූයේ බියකරු උදහසකි."**

ග්‍රීසියේ මහ ඇලෙක්සැන්ඩර් රජුගේ උරුමක්කාරයන්ගෙන් ඇන්ටිඔක්ස් රජුගේ පුත් ඇන්ටිඔකස් එපිපානෙස් නමැති පාපිෂ්ඨ පුතා ඉපිද වැඩිණි. වරක් රෝමයේ සිරකරුවකු වශයෙන් සිටි ඔහු ග්‍රීක රාජධානියේ එකසිය තිස් හත්වන වර්ෂයේ දී රජ විය. බොහෝ ජනයා මංමුළා කළ ද්‍රෝහීන් කල්ලිය බිහි වූයේ ඒ කාලයේ දී ය. ඔවුහු කතා කොට, "එන්න, අප වටේට සිටින විජාතීන්ගේ අප වෙන් වූ නිසා අපට බොහෝ දුර්භාග්‍ය පැමිණ තිබෙන බැවින් අප ඔවුන් සමඟ සම්මුතියකට පැමිණෙමු." යි කීහ. මේ යෝජනාව පිළිගත් එකක් වූ බැවින් ජනයා අතරෙන් ගණනාවක් රජු වෙත උනන්දුවෙන් ගියහ. රජ ද විජාතීන්ගේ වත්පිළිවෙත් පැවැත්වීමට ඔවුන්ට අණ කළහ. මෙලෙස ඔවුහු විජාතීන්ට තිබෙන්නාක් මෙන් ජෙරුසලමෙහි ක්‍රීඩා ශාලාවක් ගොඩ නැගුවහු ය. ඔවුහු අහක්තියට කැමැත්තෙන් සිටින වහලුන් මෙන් විජාතික පාලනයට යටත් වී චර්මඡේදන පිළිවෙත් සඟවා ගත්හ. ශුද්ධ ගිවිසුම අත් හළහ.

එකිනෙකා තම තමාගේ වත් පිළිවෙත් හැර දමා සියල්ලන් එකම ජනතාවක් වන පිණිස රජ තෙම තමාගේ මුළු රාජධානියට ප්‍රකාශයක් නිකුත් කළේ ය. මිසදිටු සියල්ලෝ ම රාජකීය ආඥාවට එකඟ වූහ. ඊශ්‍රායෙල්වරු බොහෝ දෙනෙක් ද දේව පිළිමවලට පඬුරු පුදා සබත කෙලෙසා රජුගේ ආගම පිළිගැනීමට තෝරා ගත්හ.

එකසිය හතළිස් පස් වන අවුරුද්දේ කිස්ලෙව් මාසයේ පසළොස් වන දින රජතෙම පූජාසනයට ඉහළින් "බිහිසුණු දූෂිතය" ඉදි කළේ ය. තවද ජුදා දේශය හාත්පස නගරවල ද පූජාසන ඉදි කරන ලදී. ගෙවල දොරකඩ සහ වීථිවල සුවඳ ඔප්පු කරන ලදී. ලබා ගත හැකි වූ හැම ව්‍යවස්ථා පොතක් ම ඉරන ලදුව පුළුස්සා දමන ලදී. ගිවිසුම් පිටපතක් සතුව තිබූ හෝ ව්‍යවස්ථාව පිළිපදින හෝ යමෙකු සොයා ගත් විට රාජාඥාවට පිට ඔහුට මරණය තීන්දු විය.

එහෙත්, ඉශ්‍රායෙල් ජනයා අතර නොසැලී සිටිමින් අපවිත්‍ර දේ කෑම ප්‍රතික්ෂේප කිරීමට ධෛර්යය තිබූ බොහෝ දෙනෙක් ද වූහ. එවැනි ආහාර වලින් දූෂිත වීමටත්, ශුද්ධ ගිවිසුම කෙලෙසීමටත් වඩා ඔවුන් මරණය හොඳ යයි තෝරා ගත් බැවින්, ඔවුහු මරණු ලැබූහ. ඊශ්‍රායෙල්වරුන් හට උදා වූයේ බියකරු උදහසකි!

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 119: 53, 61, 134, 150, 155, 158

**පිළිතුර: සමිඳුනි, මා පණගැන්වුව මැනව. මම ඔබ ශික්ෂ පිළිපදින්නෙමි.**

ගීය : ඔබේ ව්‍යවස්ථාව අත්හරින අදමිටුවන් දකින විට මා තුළ කෝපාග්නිය ඇවිළී යයි.
දුදනන් මට උගුලක් අටවා ඇත. එහෙත්, මම ඔබේ ව්‍යවස්ථාව අමතක කළෙමි.

මිනිසුන්ගේ හිරිහැරවලින් මා මුදාලුව මැනව.
එවිට ඔබේ නියෝග මම පිළිපදින්නෙමි.
නපුරු අරමුණු ඇති ව මට පීඩා කරන දුදනෝ මට ළඟාවෙති.
ඔවුහු ඔබේ ව්‍යවස්ථාවෙන් ඈත්ව සිටිති.

දුදනන් හට ගැළවීමක් නැත. ඔවුහු ඔබේ පණත් නොසලකති.
ද්‍රෝහිකම් කරන්නන් දැක මම ඔවුන් පිළිකුල් කළෙමි.
ඔවුහු ඔබේ නියමයන් නොපිළිපදිති.

සුපුවත් ජය නද ජුවාම් 8: 12

ආලේලූයා! ආලේලූයා!
“ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර
ජීවනයේ ආලෝකය ලබන්නේ ය” යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 18: 35–43

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**“ස්වාමීනි, මාගේ පෙනීම මට ලබා දුන මැනව.”**

ජේසුස් වහන්සේ ජෙරිකෝවට සමීප වූ කල, එක් අන්ධයෙක් සිඟමින් පාර අයිනේ ඉඳගෙන සිටියේ ය. ජනකායක් ඒ ළඟින් යනවා ඔහුට ඇසී, “ඒ කුමක්දැ” යි විමසී ය. එවිට ඔවුහු නාසරෙත්හි ජේසුස් වහන්සේ ඒ ළඟින් යන බව ඔහුට කීහ. ඔහු ද “ජේසුස් වහන්ස, දාවිත්ගේ පුත්‍රය, මට අනුකම්පා කළ මැනැවැ” යි මොර ගැසී ය. ඉදිරියෙහි ගිය අය නිශ්ශබ්ද වන ලෙස ඔහුට සැර කළහ. එහෙත්, ඔහු ශබ්ද නගා, “දාවිත්ගේ පුත්‍රය, මට අනුකම්පා කළ මැනැවැ” යි වැඩි වැඩියෙන් මොර ගැසී ය. ජේසුස් වහන්සේ නැවතී, ඔහු තමන් ළඟට ගෙනෙන්නට අණ කළ සේක. ඔහු ළඟට ආ කල, “මා ඔබට කුමක් කර දෙනවාට කැමැත්තෙහි දැ” යි ඔහුගෙන් ඇසූ සේක. “ස්වාමීනි, මාගේ පෙනීම මට ලබා දුන මැනවැ” යි ඔහු කීය. ජේසුස් වහන්සේ කතා කරමින්, “පෙනීම ලබන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුව කළේ ය” යි වදාළ සේක. එකෙණෙහි ම ඔහු ඇස් පෙනීම ලබා දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්, උන් වහන්සේ පසු පස්සේ ගියේ ය. මුළු ජනතාව තමන් දුටු දේ ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.